 සැ. යු.-2009.03.27 දින පළ කරන ලද අංක 1,595 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,596 - 2009 අප්‍රේල් මස 03 වැනි සිකුරාදා - 2009.04.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | __ | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 423 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 අප්‍රේල් මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 මාර්තු මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.

ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.

iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරිම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටි. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්ත දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසංණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කැළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකුලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනය

### ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුලත්කර ගැනීම - 2009/2010

මොරටුව විශ්වවිද්‍යාලයට අයත් තාක්ෂණික ආයතනය මඟින් පවත්වනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම පිණිස සුදුසුකම් ලත් අපේක්ෂකයන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව, මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ නව පරිශ්‍රය දියගම, හෝමාගම ස්ථාපනය කරන තෙක් මොරටුව විශ්වවිද්‍යාලයීය පරිශ්‍රය තුළ පැවැත්වෙනු ඇත.

1. සාමාන්‍ය :

ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව දෑවුරුදු අධ්‍යයන හා එක් අවුරුදු ප්‍රායෝගික යන්ත්‍රාගාර පුහුණුවකින් ද සමන්විත වේ. පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. මෙම පාඨමාලාවේ දී පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් හැදෑරීමට අවස්ථාව ලැබේ.

(අ) නාවික අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (Set 1)

(i) නාවික ඉංජිනේරු තාක්ෂණය
(ii) නෞකා චලන අධ්‍යයන හා තාක්ෂණය

(ආ) අනිකුත් අධ්‍යයන ක්ෂේත්‍රයන් (Set 2)

(i) රසායන ඉංජිනේරු තාක්ෂණය
(ii) සිවිල් ඉංජිනේරු තාක්ෂණය
(iii) විදුලි ඉංජිනේරු තාක්ෂණය
(iv) ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය
(v) යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය
(vi) පොලිමර් තාක්ෂණය
(vii) පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය

2. යෝග්‍යතාවය :

2.1 වයස හා අනිකුත් අවශ්‍යතා :

(අ) 2008.12.31 දිනට අයැදුම්කරුගේ වයස අවුරුදු 24 නොඉක්ම විය යුතුය.
(ආ) නෞකා චලන අධ්‍යයන තාක්ෂණය හා නාවුක ඉංජිනේරු තාක්ෂණය යන පාඨමාලාවන් හැදෑරීමට අපේක්ෂකයන් තෝරා ගැනීමේ දී 2008.12.31 දිනට වයස අවුරුදු 20ට අඩු අයැදුම්කරුවන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. එම පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමේදී විශේෂ වෛද්‍ය පරීක්ෂණයකට හා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමත්විය යුතු වේ.
(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති ඕනෑම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් හා වෙනත් පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් මෙම පාඨමාලාව සඳහා අයැදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

2.2 අධ්‍යාපන සුදුසුකම් :

(අ) අයැදුම්කරුවන් ශ්‍රී ලංකා විභාග කොමසාරිස් ජනරාල් විසින් 2006, 2007 හෝ 2008 වසරේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේදී එකවර පහත සඳහන් විෂයයන්ගෙන් 03ක් සමත්විය යුතුය.

(i) භෞතික විද්‍යාව
(ii) රසායන විද්‍යාව
(iii) සංයුක්ත ගණිතය

3. තෝරා ගැනීමේ පදනම/ක්‍රියාපරිපාටිය :

3.1 පාඨමාලාවට ඇතුලත් කර ගැනීම :

ශිෂ්‍යයන් තෝරා ගැනීම අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ප්‍රතිඵල හා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනය මගින් පැවැත්වෙන යෝග්‍යතා පරීක්ෂණයේ සාමාර්ථය මත සිදුවේ.

යෝග්‍යතා පරීක්ෂණය සමත් වූ ශිෂ්‍යයන් අතරින් අ. පො. ස. (උ. පෙළ) විභාග ලකුණුවල කුසලතාවය මත සිසුන් තෝරාගනු ලැබේ. (Z ලකුණු මත) 40% ක් අ. පො. ස. (උ. පෙළ) විභාගයේ කුසලතාවය මත හා 60%ක් දිස්ත්‍රික් පදනම මත ශිෂ්‍යයන් තෝරාගැනීම සිදුවේ.

3.2 අධ්‍යයන ක්ෂේත්‍රය :

යෝග්‍යතා පරීක්ෂණයේ ලකුණු හා අයැදුම්කරුගේ එක් එක් ක්ෂේත්‍රය සඳහා දක්වන කැමැත්තේ අනුපිළිවෙල, අධ්‍යයන ක්ෂේත්‍රය තෝරා ගැනීමේ දී සැළකිල්ලට භාජනය කරනු ලැබේ.

4. අයැදුම් කිරීමේ පිළිවෙල :

4.1 අයැදුම්පත් පෝරම :

(i) ගැසට් නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයැදුම්පතට අනුකූලව ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද අයැදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

ආදර්ශ අයැදුම්පත පහත සඳහන් අන්තර්ජාල වෙබ් අඩවියට පිවිසීමෙන් ද ලබා ගත හැක.
http ://www.mrt.ac.lk/itum

(ii) සම්පූර්ණ කරන ලද අයැදුම්පත බහාලන ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ "ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව ඇතුලත් වීම - 2009/2010 " යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

නියෝජ්‍ය ලේඛකාධිකාරී, තාක්ෂණික ආයතනය, මොරටුව විශ්ව විද්‍යාලය, කටුබැද්ද, මොරටුව.

(iii) තම ලිපිනය ලියන ලද රු. 40 ක් වටිනා මුද්දර ඇල වූ අඟල් 9 x 4 ප්‍රමාණයේ ලියුම් කවරයක් ද අයැදුම්පත සමඟ එවිය යුතුය.

(iv) අයැදුම්පත සමඟ සහතිකවල මුල්පිටපත් හෝ පිටපත් එවීම අවශ්‍ය නොවේ. එහෙත් අයැදුම්පතේ සඳහන් තොරතුරු අදාළ පරිදි සහතික කර තිබිය යුතුය. (අයැදුම්පතේ 03, 04 සහ 05 යන ඡේද බලන්න)

4.2 අධ්‍යයන ක්ෂේත්‍රයන් තෝරා ගැනීම :

(i) මෙම පාඨමාලාව අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩ දෙකකින් සමන්විත වේ.
(ii) නාවික අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (SET 1) හෝ අනිකුත් අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (SET 2) හෝ ක්ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා ඉල්ලුම් කළ හැක. ක්ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා අයැදුම්කරන්නේ නම් ප්‍රමුඛතාවය සඳහන් කළ යුතුය.
(iii) නාවික අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩයේදී එනම් නාවුක ඉංජිනේරු තාක්ෂණය සහ නෞකා චලන අධ්‍යයන තාක්ෂණය (SET 1) සඳහා ප්‍රමුඛතාවය සඳහන් කිරීමේ දී වඩාත් කැමති ක්ෂේත්‍රය 01 ලෙස ද අනෙක් ක්ෂේත්‍රය 02 ලෙස ද සඳහන් කළ යුතුය.
(iv) අනිකුත් ක්ෂේත්‍ර කාණ්ඩය (SET 2) සඳහා ප්‍රමුඛතාවය 1, 2, 3, 4, 5, 6, 7 සඳහන් කළ යුතු අතර වඩාත් කැමති ක්ෂේත්‍රය 01 ලෙස ද ඊළඟ ක්ෂේත්‍රය 02 ලෙස ද අන්තිම ක්ෂේත්‍රය 07 ලෙස සඳහන් කළ යුතුය.

(i) ඉල්ලුම් පත්‍ර ගාස්තු :

ඉල්ලුම් පත්‍ර ගාස්තු වශයෙන් එක් ක්ෂේත්‍රයක් සඳහා රු. 300 (තුන්සීයක්) හෝ ක්ෂේත්‍රයන් දෙකටම රු. 500 (පන්සීයක්) ගෙවිය යුතු අතර, එම ගෙවීම ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය - ලංකා බැංකුවේ කටුබැද්ද ශාඛාවේ ගිණුම් අංක 0000308280 දරන ගිණුමට බැර වන සේ ගෙවිය යුතුය. මෙම අයැදුම්පත් ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

(ii) අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2009.04.30 දින වේ.

6. යෝග්‍යතා පරීක්ෂණය :

අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ප්‍රතිඵල, කුසලතා පදනම මත හා එක් එක් දිස්ත්‍රික්කයට අදාළ ලඝු කළ සිසුන් ප්‍රමාණය මත, මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයට කැඳවනු ලැබේ.

7. පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම :

(i) යම් පාඨමාලාවක් සඳහා තෝරා ගන්නා ලද අපේක්ෂකයන්, පාඨමාලාව සඳහා ලියාපදිංචි කරනු ලබන දින, පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

අ. පො. ස. (උ. පෙළ) සහතිකය.
අ. පො. ස. (උ. පෙළ) Z ලකුණු සඳහන් සහතිකය.

පාසල හැරයාමේ සහතිකය.
උප්පැන්න සහතිකය.
නමේ වෙනසක් ලියකියවිලිවල හා සහතිකපත්වල ඇත්නම් දිවුරුම් ප්‍රකාශයක්.

8. ඉතා වැදගත් ඃ

(ii) ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි වන කිසිම අපේක්‍ෂකයකු, එම පාඨමාලාවේ කාලසීමාව තුළදී, මෙම විශ්වවිද්‍යාලයේ වෙනත් පාඨමාලාවක් හෝ ශ්‍රී ලංකාවේ පිහිටා ඇති අන් කිසිම විශ්වවිද්‍යාලයක පාඨමාලාවක් හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක පාඨමාලාවක් හැදෑරීමට සුදුසුකම් නොලබයි. (විවෘත විශ්වවිද්‍යාලය හැර)

(iii) ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි වන කිසිම අපේක්‍ෂකයකු, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති කිසිම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

අධ්‍යක්‍ෂ,
මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්‍ෂණික ආයතනය.

මොරටුව විශ්වවිද්‍යාලය,
කටුබැද්ද,
මොරටුව.

දිනය ඃ 2009 මාර්තු මස 16 වැනි දින

SPECIMEN APPLICATION FORM

| | | | | | |
|---|---|---|---|---|---|
| Application For Admission to the<br>National Diploma in Technology Course<br><br>INSTITUTE OF TECHNOLOGY,<br>UNIVERSITY OF MORATUWA<br><br>Academic Year 2009/2010 | *For office use only* | | | | |
| | Application No. | | | | |
| | District | | | | |

Application For (Please tick (✓))

| | | | | |
|---|---|---|---|---|
| (1) | Maritime Fields | - | (SET 1) | ☐ |
| (2) | Other Fields | - | (SET 2) | ☐ |

[Applicants may apply for single set (Set 1 or Set 2) or both sets (Set 01 and Set 02)]

(Please Use **BLOCK CAPITALS**)

01. Personal Details

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| Name in Full | | | | | | | |
| | (Leave one blank cage between names) | | | | | | |
| Name with Initials : | | | | | | | |
| | (Leave one blank cage between names) | | | | | | |
| Title | Mr./Ms. | | Sex | Male/Female | | | |
| Age<br>As at 31st Dec. 2008 | (Years) | (Months) | Date of Birth | Date | Month | Year | |
| National ID Number | | | | | | | |

02. Contact Details :

| | |
|---|---|
| Address (Residence): | |
| | (Leave one blank cage between different segments of the address) |
| Telephone | Mobile |
| 3-mail (if available) | |

03. Results of G. C. E. (Advance Level) Examination :

| *Subjects & Details of Examination* | *Grades & Details obtained at the* | | |
|---|---|---|---|
| | *1st attempt* | *2nd attempt* | *3rd attempt* |
| *Year* | | | |
| Physics | | | |
| Chemistry | | | |
| Combined Mathematics | | | |
| Advanced Mathematics | | | |
| Index Number | | | |
| Z-Score | . | . | . |
| Medium | Sinhala/Tamil/English (Delete whatever is inapplicable) | | |
| Results of the year to be considered for Selection (indicate whether) 2006 or 2007 or 2008) | | | |

04. School(s) attended from Year 11 to 13

| *Year* | | *Name & Address of School* | *District* | *Period of Attendance* | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | *From* | | | *To* | | |
| | | | | *Year* | *M* | *D* | *Year* | *M* | *D* |
| 11 | | | | | | | | | |
| 12 | | | | | | | | | |
| 13 | 1st Attempt | | | | | | | | |
| | 2nd Attempt | | | | | | | | |
| | 3rd Attempt | | | | | | | | |

05. Certification of Results and School attended :

It is compulsory to certify the Results under No. 03 and Details under No. 04 in the application by the School Principal for the School Candidates, and by a Justice of Peace for External Candidates.

I certify that the particulars given above by the candidate in the cage No.3 and 4 are true and accurate according to the Original Certificates.

Name of the Principal/Justice of the peace : Rev./Dr./Mr./Mrs. ....................................................................................

Official Seal :………….

......................., ....................,
Signature. Date.

06. Field Preference :

Set 1 - Insert order of preference as 1 for First preference and 2 for Second preference. This should be completed only by the candidates who have applied for Maritime Studies.

Set 2 - Insert order of preference as 1, 2, 3, 4, 5, 6, 7. '1' for the "Most Preferred", '2' for the next and so on '7' for the last preferred.

| *Set 1* | | *Set 2* | |
|---|---|---|---|
| *Maritime Fields* | *Order* | *Other Fields* | *Order* |
| Marine Engineering Technology | | Chemical Engineering Technology | |
| Nautical Studies and Technology | | Civil Engineering Technology | |
| | | Electrical Engineering Technology | |
| State Priority, if applied for both sets - ✓ | | Mechanical Engineering Technology | |
| SET 1 | | Polymer Technology | |
| SET 2 | | Textile & Clothing Technology | |

| | | |
|---|---|---|
| Are you registered as a fulltime student in any other University under the UGC (other than Open University) or any other Higher Educational Institution under the Ministry of Education ? (Delete whatever is inapplicable) | Yes | No |

Applicant's Declaration :

(i) I declare that I am not a fulltime registered student at any University (except Open University of Sri Lanka) or any Higher Educational Institution under the Ministry of Education.

(ii) I certify that all the particulars given by me in this Application are true and accurate. I am aware that if the particulars given by me in this Application are found to be false or inaccurate prior to my admission I will be discontinued from the course.

(iii) In the event of my being selected for admission after the Test, I shall abide by Statutes, By-Laws, Regulations and Rules of the Institute of Technology, University of Moratuwa, in so far as they are applicable to me.

(iv) I have pasted the Cash deposit/ Cash transfer receipt obtained from Bank of Ceylon, drawn in favour of "Institute of Technology, University of Moratuwa - Account No. 0000308280 of Bank of Ceylon, Katubedde Branch".

(v) I also enclose a Self addressed stamped envelope (Rs. 40 worth) in size 9" x 4".

(iv) I am aware that if I am found to be registered in another University or any other Higher Educational Institution under the Ministry of Education at the time of sitting for the Aptitude Test for the National Diploma in Technology Course, I will not be selected for the Course.

------------,
Signature of Applicant.

Date :---------.

| |
|---|
| Paste your Cash Deposit/Cash Transfer Original Slip here. |

04-47

---

**මධ්‍යම ආණ්ඩුව යටතේ ජාතික පාසල් සඳහා බඳවා ගත් කළමනාකරණ සහකාර තනතුරුධාරීන් සඳහා වන පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2009**

01. ඉහත තනතුරුවලට අයත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2009 ජූලි මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලබේ.

02. i. මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

ii. විභාග අපේක්ෂකත්වය ලැබීම සඳහා පනවා ඇති නීති, ගැසට් නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝණය කළහොත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත.

iii. මෙම විභාගය සඳහා ඉල්ලුම් කළ හැක්කේ මධ්‍යම ආණ්ඩුව යටතේ ජාතික පාසල් සඳහා බඳවා ගනු ලැබූ කළමනාකරණ සහකාර තනතුරුධාරීන් සඳහා පමණි.

iv. මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට නියමිත විෂයයන් දෙකම, එක් වතාවක දී හෝ දෙවතාවක දී පෙනී සිට සමත් විය හැකිය.

03. *විභාග ගාස්තු.*—මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පළමුවැනි වතාවට ඉදිරිපත්වන අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අය නොකෙරේ. ඉන් පසු වතාවකට පෙනී සිටින්නේ නම් රුපියල් 250 ක විභාග ගාස්තුවක් අය කෙරේ. (එක් විෂයයක් නම් රුපියල් 125) මෙම විභාග ගාස්තුව, විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 4000-20-03-20-13ට බැරවන ලෙස, දිවයින්නේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන සේ එහි දාරයක් ඇලවිය යුතුය.

(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

04. *අයදුම්පත්‍ර :* ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. මෙම ආදර්ශ අයදුම්පත අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 04 තෙක් පළමුවන පිටුවටත්, ඉතිරිය දෙවන පිටුවටත් වන ලෙස ගෙන සකස් කළ යුතුය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර පිළියෙල කර ගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත්අකුරෙන්ම සම්පූර්ණ කළ යුතුය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අපේක්ෂකයින් විසින් සිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/පීඨාධිපති/දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2009.04.30 වැනි දිනට පෙර ලැබෙන සේ බත්තරමුල්ල, පැලවත්ත, විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත එවීමේ දී ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත සමග පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපතක් ද අමුණා එවිය යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් හා භාර ගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එසේ නොවුනහොත් ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

05. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :-* අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කුමක් වුවද භාර ගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

2. වලංගු විදේශීය ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේකෂකත්වය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වේ.

06. අයදුම්පත් පිළිගෙන ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව

සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

07. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08. තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යය හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයිය හැකිය. තමන් ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය පැවැත්වෙන්නේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණි.

09. මෙම විභාගය කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

10. *විභාග පරිපාටිය.*- (ඉහත තනතුරුවලට අදාළ විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වනු ඇත.)

| *විෂයය* | *විෂය අංකය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| 01. ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | 01 | 100 යි | පැය 03 යි |
| 02. සංවර්ධන පරිපාලනය | 02 | 100 යි | පැය 03 යි |

(01) පළමුවන ප්‍රශ්න පත්‍රය (ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි)

I. ආයතන සංග්‍රහයේ I, II, VI, XII පරිච්ඡේද
II. ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ සියලු පරිච්ඡේද
III. මුදල් රෙගුලාසි IV සහ පරිච්ඡේද V පරිච්ඡේද

(02) දෙවන ප්‍රශ්න පත්‍රය (සංවර්ධන පරිපාලනය)

I. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා එකී 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය.
II. පළාත් සභා පනත හා එකී සංශෝධන
III. අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය හා එහි විවිධ මට්ටම්වලට පැවරෙන රාජකාරි විස්තර.
(සාමාර්ථ්‍යයක් සඳහා ලකුණුවලින් අවම වශයෙන් 40% ක් නිලධාරීන් විසින් ලබා ගත යුතු වේ.)

11. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

12. මෙම විභාග නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

එම්. එම්. එන්. ඩී. බණ්ඩාර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2009 මාර්තු මස 18 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය", බත්තරමුල්ල.

*ආදර්ශ අයදුම්පත්‍රය*

***මධ්‍යම ආණ්ඩුව යටතේ ජාතික පාසල් සඳහා බඳවා ගනු ලැබූ කළමනාකරණ සහකාර තනතුරුධාරීන් සඳහා වන පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2009***

First Efficiency Bar Examination for Management Assistants recruited for National Schools under the Central Government - 2009

විභාග අංකය : [ ]

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

01. මුලකුරු අගට යොදා අයදුම්කරුගේ මුලකුරු සමග නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: SUNIL, J.M.U.

1.1 මුලකුරුවලින් හැඳින්වෙන නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.3 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

02. සේවා ස්ථානය හා ලිපිනය :

2.1 විදුහලේ/විද්‍යා පීඨයේ/ගුරු විදුහලේ/කාර්යාලයේ නම :——————.

2.2 රාජකාරි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. දැනට දරන තනතුර :
(පත්වීම් ලිපිනයේ සහතික කරන ලද පිටපතක් අමුණන්න)

3.1 පත්වීම් ලිපියේ අංකය :————.

3.2 පත්වීම් දිනය :————.

04. ඔබ දැන් ඉදිරිපත්වන විෂයය/විෂයයන් (ගැසට් නිවේදනයේ 10 ඡේදය බලන්න)

| *අනු අංකය* | *විෂයය* | *විෂයය අංකය* |
|---|---|---|
| 01. | | |
| 02. | | |

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම ඇති බවත් ප්‍රකාශ කරන අතර, මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟවන බව ද ප්‍රකාශ කර සිටිමි.

————.
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය:————.

සටහන.- තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

| ලදු පත් මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |
|---|

**අත්සන සහතික කිරීම**

මගේ කාර්යාලයේ/විදුහලේ/විද්‍යා පීඨයේ/ගුරු විදුහලේ නිලධාරියකු/ නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ………… ……………………….. මහතා/මිය/මෙනෙවිය ............................ දින මා ඉදිරිපිටදී අත්සන් කළ බව මම සහතික කරමි.

————,
අත්සන සහතික කරන්නාගේ අත්සන
හා නිල මුද්‍රාව.
(විදුහල්පති/පීඨාධිපති/ගුරු විදුහල්පති/
මාණ්ඩලික නිලධාරී)

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :**

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
2. පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපතක් අමුණා ඇති බවත්,
3. නිලධාරියා/නිලධාරිණිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව.
(කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/පීඨාධිපති/
දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

04-79

**අධ්‍යාපන අමාත්‍යාංශයට බඳවා ගත් සංවර්ධන සහකාර සහ සැලසුම්/මූල්‍ය සහකාර නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2009**

01. ඉහත තනතුරුවලට අයත් නිලධාරීන් සඳහා අදාල අනුමත බඳවා ගැනීමේ පරිපාටිවල විධි විධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් ශ්‍රී ලංක විභාග දෙපාර්තමේන්තුව විසින් 2009 ජූලි මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලබේ.

02.(i). මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(ii). විභාග අපේක්ෂකත්වය ලැබීම සඳහා පනවා ඇති නීති ගැසට් නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝණය කළහොත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත.

(iii). මෙම විභාගය සඳහා ඉල්ලුම් කළ හැක්කේ **අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පත්වීම් ලද** අදාල නිලධාරීන්ට පමණි.

03. *විභාග ගාස්තු.-* මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පළමුවන වතාවට ඉදිරිපත්වන අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අය නොකෙරේ. ඉන් පසු වතාවකට පෙනී සිටින්නේ නම් රුපියල් 200 ක විභාග ගාස්තුවක් අය කෙරේ. මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 4000-20-03-20-13 ට බැරවන ලෙස, දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයක් ඇලවිය යුතුය.

(ලදුපතේ ඡායා පිටපතක් ලඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

04. *අයදුම්පත්‍ර.-* ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. මෙම ආදර්ශ අයදුම්පත අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 03 තෙක් පළමුවන පිටුවටත්, ඉතිරිය දෙවන පිටුවටත් වන ලෙස ගෙන සකස් කළ යුතුය. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතර ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදීමට අවශ්‍යය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර පිළියෙල කර ගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතුය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අපේක්ෂකයින් විසින් සිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/පීඨාධිපති/දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් 2009 අප්‍රේල් 30 වැනි දිනට පෙර ලැබෙන සේ බත්තරමුල්ල, පැලවත්ත, විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි තැපෑලෙන එවිය යුතුය. අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත සමග පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපතක් ද අමුණා එවිය යුතුය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා භාර ගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එම ඉල්ලුම්පතේ ඡාය පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජන වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එසේ නොවුනහොත් ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත.

05. *අපේක්කයින්ගේ අනන්‍යතාව.*—අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කුමක් වුවද භාර ගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

2. වලංගු විදේශීය ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වේ.

06. අයදුම්පත් පිළිගෙන ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත්කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් මේ දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩත් ඵලදායි වනු ඇත.

07. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08. තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යය හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයිය හැකිය. තමන් ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය පැවැත්වෙන්නේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණි.

09. මෙම විභාගය කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

10. *විභාග පරිපාටිය*.- ඉහත තනතුරුවලට අදාළ විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වනු ඇත.

**මෙම විභාගය සඳහා පහත සඳහන් විෂයයන්ගෙන් යුත් එක් ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයිය යුතු වේ. (කාලය පැය 02 යි.)**

(i) සාමාන්‍ය පරිපාලනය : කාර්යාල කළමනාකරණය
ආයතන සංග්‍රහයේ විධි විධාන සහ කාර්යාල කළමනාකරණය, ආයතන සංග්‍රහයේ I, II, V, VI, VII, VIII, XII, XIV, XV, XVI, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXII පරිච්ඡේදයන් අදාළ වේ.

(ii) මුදල් රෙගුලාසි හා ගිණුම් කටයුතු :

(අ) රජයේ මුදල් රෙගුලාසි 1 වැනි කොටස ( X වැනි පරිච්ඡේදය හැර)

සාමාර්ථයක් ලැබීම සඳහා ලකුණුවලින් අවම වශයෙන් 40% ක් නිලධාරීන් විසින් ලබා ගත යුතු වේ.

11. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

12. මෙම විභාග නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

එම්. එම්. එන්. ඩී. බණ්ඩාර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2009 මාර්තු 18 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය",
බත්තරමුල්ල.

***ආදර්ශ අයදුම් පත්‍රය***

***අධ්‍යාපන අමාත්‍යාංශයේ සංවර්ධන සහකාර සහ සැලසුම්/මූල්‍ය සහකාර නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2009***

First Efficienty Bar Examination for Officers belonging to Posts of Development Assistant and Planning/Financial Assistant recruited under the Ministry of Education - 2009

විභාග අංකය : [ ]

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

01. මුලකුරු අගට යොදා අයදුම්කරුගේ මුලකුරු සමග නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) *උදා:* SUNIL, J.M.U.

1.1 මුලකුරුවලින් හැඳින්වෙන නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.3 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

02. සේවා ස්ථානය හා ලිපිනය :

2.1 විදුහලේ/විද්‍යා පීඨයේ/ගුරු විදුහලේ/කාර්යාලයේ නම :——.
2.2 රාජකාරී ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. දැනට දරන තනතුර :
(පත්වීම් ලිපිනයේ සහතික කරන ලද පිටපතක් අමුණන්න)

3.1 පත්වීම් ලිපියේ අංකය :————.

3.2 පත්වීම් දිනය :————.

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම ඇති බවත් ප්‍රකාශ කරන අතර, මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟවන බව ද ප්‍රකාශ කර සිටිමි.

————.
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන

දිනය:————.

සටහන.- තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිට දී අයැදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

| |
|---|
| ලදු පත මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජන වනු ඇත.) |

**අත්සන සහතික කිරීම**

මගේ කාර්යාලයේ/විදුහලේ/විද්‍යා පීඨයේ/ගුරු විදුහලේ නිලධාරියකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ……………………………….මහතා/මිය/මෙනෙවිය ............................ දින මා ඉදිරිපිටදී අත්සන් කළ බව මම සහතික කරමි.

————,
අත්සන සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව.
(විදුහල්පති/පීඨාධිපති/ගුරු විදුහල්පති/මාණ්ඩලික නිලධාරි)

නම :————.

පදවි නාමය :————.

ලිපිනය :————.

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ඃ

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
2. පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපතක් අමුණා ඇති බවත්,
3. නිලධාරියා/නිලධාරිණිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන හා
නිල මුද්‍රාව.
(දෙපාර්තමේන්තු ප්‍රධානියා/කලාප
අධ්‍යාපන අධ්‍යක්ෂ/පීඨාධිපති)

නම :————.

පදවි නාමය :————.

ලිපිනය :————.

දිනය :————.

04-80

---

**ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2007 (2009) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

ඉහත තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා 2009.03.06 දින පළ කර තිබූ රජයේ ගැසට් නිවේදන අංක 1592 හි දැක්වෙන අයැදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2009.04.24 දින දක්වා දීර්ඝ කරන ලදී. එහි 7 ඡේදයේ විභාග ගාස්තු යටතේ දැක්වෙන ආදායම් ශීර්ෂ 6 උපශීර්ෂ 1 විෂය 4 උපවිෂය 4ට බැර කිරීම සඳහා ගෙවිය යුතුය යන්න පහත පරිදි සංශෝධනය විය යුතුය.

ආදායම් ශීර්ෂ 4000-20-03-20-13ට බැර කිරීම සඳහා ගෙවිය යුතුය.

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

2009 මාර්තු මස 18 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

04-118

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

වෘත්තීය සහ කාර්මික පුහුණු අමාත්‍යාංශය

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව**

***ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ (විශේෂ සේවක සංඛ්‍යාවේ) III පන්තියේ කථිකාචාර්ය තනතුරු***

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ වන තාක්ෂණ විද්‍යාලයන් සඳහා ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ III පන්තියේ කථිකාචාර්ය තනතුරු සඳහා අයැදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු අංකය | තනතුර | ඉගැන්වීමේ මාධ්‍යය | පුරප්පාඩු ඉංග්‍රීසි මාධ්‍ය |
|---|---|---|---|
| 01 | සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය | ඉංග්‍රීසි මාධ්‍ය | 12 |
| 02 | විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය | ඉංග්‍රීසි මාධ්‍ය | 02 |
| 03 | විද්‍යුත් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය | ඉංග්‍රීසි මාධ්‍ය | 02 |
| 04 | ශීතකරණ හා වායුසමීකරණය පිළිබඳ කථිකාචාර්ය | ඉංග්‍රීසි මාධ්‍ය | 08 |
| 05 | ආහාර තාක්‍ෂණය පිළිබඳ කථිකාචාර්ය | ඉංග්‍රීසි මාධ්‍ය | 06 |
| 06 | යාන්ත්‍රික ඉංජිනේරු හා (ස්වයං චලන තාක්‍ෂණය) පිළිබඳ කථිකාචාර්ය | ඉංග්‍රීසි මාධ්‍ය | 12 |
| 07 | යාන්ත්‍රික ඉංජිනේරු හා පෑස්සුම් ශිල්පය පිළිබඳ කථිකාචාර්ය | ඉංග්‍රීසි මාධ්‍ය | 12 |
| 08 | තොරතුරු තාක්‍ෂණ පිළිබඳ කථිකාචාර්ය | ඉංග්‍රීසි මාධ්‍ය | 14 |
| 09 | මුද්‍රණ තාක්‍ෂණ පිළිබඳ කථිකාචාර්ය | ඉංග්‍රීසි මාධ්‍ය | 04 |
| 10 | ස්වර්ණාභරණ පිළිබඳ කථිකාචාර්ය | ඉංග්‍රීසි මාධ්‍ය | 08 |
| 11 | යාන්ත්‍රික ඉංජිනේරු මෙකාට්‍රොනික් කථිකාචාර්ය | ඉංග්‍රීසි මාධ්‍ය | 08 |
| 12 | නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ කථිකාචාර්ය | ඉංග්‍රීසි මාධ්‍ය | 04 |
| 13 | ජීව වෛද්‍ය තාක්‍ෂණය පිළිබඳ කාථිකාචාර්ය | ඉංග්‍රීසි මාධ්‍ය | 04 |

පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයැදුම්පත් 2009 අප්‍රේල් 30 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "අධ්‍යක්‍ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, තැ. පෙ. 557, කොළඹ 10" යන ලිපිනයට එවිය යුතුය. අයැදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරෙහි "ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ III පන්තියේ (විශේෂ සේවක සංඛ්‍යාවේ) තනතුරු" යනුවෙන් සඳහන් කළ යුතුය. එක් තනතුරකට වඩා වැඩි තනතුරු සංඛ්‍යාවක් සඳහා අයැදුම් කරන්නේ නම්, අයැදුම්පතේ තමන් තනතුරු තෝරාගන්නා අනුපිළිවෙල අනුව තනතුරු අංක හා තනතුරු නාමයන් සඳහන් කර එවිය යුතුය. ගැසට් නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් ලැබූ අය පමණක් ලිඛිත විභාගයට කැඳවනු ලැබේ.

02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත වන අතර තෝරාගන්නා අපේක්‍ෂකයින් වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු අතර තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

**කාර්යක්ෂමතා කඩඉම**

(ආ) සෑම නිලධාරියෙකුම තම පත්වීමේ දින සිට තුන් අවුරුදු කාලසීමාවක් තුළ කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. නියමිත කාලය ඇතුළතදී කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට අපොහොසත් වීම වැටුප් වර්ධක විලම්භනය කිරීමට හේතුවන අතර, දී ඇති කාලසීමාව ඉක්මවා ගන්නා කාලය වැටුප් වර්ධක විලම්භනය කෙරෙන කාලසීමාව වශයෙන් සැලකෙනු ඇත. තවද, මෙම නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කරන තෙක් ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ කිසිම උසස් තනතුරක් සඳහා අයැදුම් කිරීමටද නුසුදුස්සන් වනු ඇත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2001 ට අනුව 04 වැනි වැටුප් පියවරට එළැඹීමට පෙර පළමු කාර්යක්‍ෂමතා කඩඉමද 07 වැනි වැටුප් පියවරට එළැඹීමට පෙර දෙවැනි කාර්යක්‍ෂමතා කඩඉම ද සමත් විය යුතුය.

(ඇ) මෙම තනතුරු සඳහා බඳවා ගනු ලබන නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව සේවයට බැඳී වසර 05ක් ඇතුළත දෙවැනි භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතුය. එසේ එම කාලය තුළ නියමිත භාෂා ප්‍රවීනතාවය ලබාගැනීමට අපොහොසත් වන නිලධාරීන්ගේ වැටුප් වර්ධක විලම්භනය කරනු ලැබේ. මෙම නිලධාරීන් සඳහා භාෂා ප්‍රවීනතාවයන් වනුයේ.

අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ ප්‍රධාන විෂයයන් ලෙස සමත්වීම (දෙවැනි භාෂාව හෝ වෛකල්පිත විෂයයක් වශයෙන් නොවේ) හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වන කථන විභාගයකින් සමත්වීම හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන විශේෂිත කුසලතා විභාගයෙන් සමත් වීම.

03. වැටුප් හා දීමනා :

මෙම තනතුරට ආදළ මාසික ඒකාබද්ධ වැටුප් ක්‍රමය රු. 22,935-645x10-790x8-1050-17-53,555 වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ එස්එල්-1-2006 අනුව වැටුප් ගෙවනු ලැබේ. වැටුප් වර්ධක ගෙවීම ඉහත 02 ඡේදයේ "ආ " හි සඳහන් කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට යටත් වනු ඇත.

04. සුදුසුකම් :

(අ) ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.
(ආ) ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා 35ට නොවැඩි විය යුතුය.
(ඇ) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
(ඈ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.
(ඉ) අධ්‍යාපන

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබා ඇති අදාළ විෂය ක්ෂේත්‍රයේ උපාධියක් සහිතව අවුරුදු 5ක ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම.

05. බඳවා ගැනීමේ ක්‍රමය :

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන තාක්ෂණ විද්‍යාල සඳහා ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ III වැනි පන්තියේ කථිකාචාර්ය පුරප්පාඩු සඳහා විවෘත තරග විභාගයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ව්‍යවස්ථාව ප්‍රකාරව පත්වීම් බලධරයා වෙනුවෙන් මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

06. පහත සඳහන් ලියකියවිලි සියල්ලේම තමා විසින් සත්‍ය බවට සහතික කරන ලද පිටපතක් අයැදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය :-

(i). උප්පැන්න සහතිකය (සැ. යු. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ හෞතිස්ම සහතික භාර ගනු නොලැබේ).
(ii). උපාධි සහතික හෝ අනෙකුත් අධ්‍යාපන සහතික
(iii). වෘත්තීය සහ/හෝ තාක්ෂණික සුදුසුකම් දැක්වෙන සහතික
(iv). සිංහයෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය

07. රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයින්ගේ අයැදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වේ.

08. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි සහ 1986.08.15 දිනැති අංක 415 දරන රජයේ ගැසට් පත්‍රයේ සාමාන්‍ය 1 කොටස යටතේ ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවා ව්‍යවස්ථා සංග්‍රහය කෙරෙහි ද අපේකයින්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

09. සියලුම අයැදුම්කරුවන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය :-

| | | |
|---|---|---|
| (i). | සාමාන්‍ය දැනීම ප්‍රශ්න පත්‍රය | ලකුණු 100 යි පැය එකක ප්‍රශ්න පත්‍රයකි. |
| (ii). | බුද්ධි පරීක්ෂණය | ලකුණු 100යි පැය එකක ප්‍රශ්න පත්‍රයකි. |

තරග විභාගයේ කුසලතාවය අනු පිළිවෙල අනුව සුදුසුකම් ලබන අයැදුම්කරුවන් බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් තහවුරු කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. (සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දෙනු නොලැබේ. එක් එක් විෂයයේ ලකුණු 40% හෝ ඊට වැඩිය ලබාගත් අයැදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුව අනුව ප්‍රමුඛතා ලේඛනය සකස් කරනු ලැබේ.

10. නිර්දේශ පත්‍රය :

10.1 සාමාන්‍ය දැනුම පැය 1 (එක යි)

අපේක්ෂකයා තුළ ඇති ආර්ථික, සමාජයීය, දේශපාලනික, භූගෝලීය හා භූ විද්‍යාත්මක කරුණු පිළිබඳව දේශීය හා ජාත්‍යන්තර මට්ටමෙන් අපේක්ෂකයා තුළ ඇති දැනුම පිරික්සීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇති අතර, එම ප්‍රශ්න පත්‍රයේ සමහර ප්‍රශ්න කෙළින්ම අපේක්ෂකයා වෙත ඉදිරිපත් කර එයට නිවැරැදි පිළිතුරු බලාපොරොත්තු වන ආකාරයටත්, තවත් සමහර ප්‍රශ්න අපේක්ෂකයා වෙත ප්‍රශ්න කීපයක් ඉදිරිපත් කර එයින් නිවැරදි පිළිතුරු තෝරා ගැනීම පිළිබඳ අපේක්ෂකයාට ඇති හැකියාව පරීක්ෂා කිරීම සඳහාත් සකස් කර ඇත.

10.2 බුද්ධි පරීක්ෂණය - පැය 1 (එක යි)

පැය එකකට සීමාවන මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත්තේ, අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවය හා ඔහුගේ තීරණ ගැනීමේ ශක්තිය විනිශ්චය කිරීම සඳහාය. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ක්‍රමයට සකස් කොට ඇත.

11. විභාග දිනය : මෙම විභාගය 2009 ජුනි මස මුල් සතියේ කොළඹ නගරයේදී (නගර අංක 01) හා යාපනය නගරයේදී (නගර අංක 02) පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම්ට බලය ඇත. මේ අනුව විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය හා නගර අංකය නිවැරදිව ඉල්ලුම්පත්‍රයේ අදාළ ස්ථානයේ සටහන් කරන්න. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට කිසිසේත්ම ඉඩදෙනු නොලැබේ.

12. විභාග ගාස්තු.—විභාගය සඳහා වූ ගාස්තුව රු. 300 කි. එය ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පළමුව මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ මහජන බැංකුව නගර මධ්‍ය ශාඛාවේ අංක 176-1001-39026228 ගිණුමට මුදල් බැර කර ලබා ගත් ලදුපත ඉල්ලුම් පත්‍රයේ අදාළ කොටුවෙහි ඇලවිය යුතුය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදු පතෙහි ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

13. විවෘත තරඟ විභාගයේ අනු පිළිවෙල අනුව වැඩි ලකුණු ලබා ගත් අපේක්ෂකයින් පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

14. පුරප්පාඩු වලින් කොටසක් හෝ සියල්ල හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

15. ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 10 සිට 12 ඡේදයන්හි වගන්ති තනතුරට ගැලපෙන පරිදි අදාළ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

තිලක් හපන්ගම,
ලේකම්,
වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය.

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය,
ඇල්විටිගල මාවත,
කොළඹ 05.

**ආදර්ශ අයදුම් පත්‍රය**

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ වන ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ (විශේෂ සේවක සංඛ්‍යාවේ) III වන පන්තියේ කථිකාචාර්ය තනතුරු**

***.........................................තනතුර සඳහා අයදුම්පත***

| ඉල්ලුම්කරන තනතුරු අංක කැමැත්තේ අනුපිළිවෙල අනුව | තනතුර |
|---|---|
| i. | |
| ii. | |
| iii | |

1.0 භාෂා මාධ්‍ය :
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

මාධ්‍යය : ☐

සිංහල-2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

2.0 නගරය :
විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය

එම නගර අංකය ☐☐

(ගැසට් නිවේදනයේ II වන ඡේදයට අනුව)
නගරය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

01. නම (මුලකුරු සමග) : ☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐

උදාහරණ : SILVA A. B.

02. සම්පූර්ණ නම : ☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐
☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐
☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐

03. රාජකාරි ලිපිනය :

04. පෞද්ගලික ලිපිනය (මෙම ලිපිනයට ප්‍රවේශපත් තැපැල් කරනු ලැබේ.)

05. (අ) ශ්‍රී ලාංකිකයෙකු ද යන වග :

(ආ) එසේ නම් පරම්පරාවෙන් ද, ලියාපදිංචි වීමෙන් ද යන වග :————.

06 (අ) උපන් දිනය :

වර්ෂය මාසය දිනය

(ආ) ජාතික හැඳුනුම්පත් අංකය :

07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු මාස දින

08. විවාහක/අවිවාහක බව :————.

09. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :

(අ) තනතුර හා පත්වීමේ දිනය :————.
(ආ) තනතුර ස්ථිර ද තාවකාලික ද යන වග :————.
(ඇ) තනතුර විශ්‍රාම වැටුප් සහිත ද යන වග :————.
(ඈ) තනතුරෙහි ස්ථිර කර ඇත් ද යන වග :————.
(ඉ) දෙපාර්තමේන්තුව :————.
(ඊ) ආයතනය/සේවා ස්ථානය :————.
(උ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණය :————.
(ඌ) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :————.

10. අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ විස්තර (සිංහල, දෙමළ භාෂාවෙහි ප්‍රවීනතාවය පිළිබඳ සහතික ද ඇතුළුව)

| විභාගය | විශ්ව විද්‍යාලය/ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

11. වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර

| සහතිකය | සහතිකය නිකුත් කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

12. සාමාන්‍ය අධ්‍යාපනය ලද ආයතන

| ආයතනය | පන්තිය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

13. වෘත්තීය අධ්‍යාපනය ලද ආයතන

| ආයතනය | පාඨමාලාව | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

14. කලින් දරන තනතුරු (වකවානු පිළිවෙලින් නිවැරදි දින සහිතව සඳහන් කරන්න)

| දෙපාර්තමේන්තුව | ආයතනය/සේවා ස්ථානය | තනතුර | තනතුර ස්ථිර ද තාවකාලික ද යන වග | සිට | දක්වා |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |

15. ඔබ අධිකරණයක් මගින් වරදකරු වී තිබේ ද? එසේ නම් විස්තර දක්වන්න. :————.

16. මීට පෙර රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ මණ්ඩලයක සේවයේ නියුක්තව සිටියේ නම් සේවයෙන් ඉවත්වීමට/ඉවත් කිරීමට හේතුව දක්වන්න. :————.

17. ඔබට විරුද්ධව කිසියම් විනයානුකූලව පරීක්ෂණයක් පැවැත්වෙමින් තිබේ ද? එසේ නම් විස්තර කෙටියෙන් දක්වන්න. :————.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

මා විසින් මෙම අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති විස්තර සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි සඳහන් විස්තර සාවද්‍ය බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් එයින් මා නුසුදුස්සෙකු වීමට ඉඩ ඇති බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත්, කිසියම් වන්දියක් නොලබා මා රාජකාරියෙන් පහ කිරීමට යටත් වන බව ද මම දනිමි.

————.
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දිනය :————.

04-119

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

*** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … … … | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය … … … … … … … … | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) … … … | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස … … … … … … … | 580 00 | 3,120 00 |
| III වැනි කොටස … … … … … … … | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … … … | 890 00 | 2,400 00 |
| V වැනි කොටස … … … … … … … … | 860 00 | 420 00 |
| VI වැනි කොටස … … … … … … … … | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය … … … … … … … … | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | **පිටපතක මිළ** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … … … | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 25 00 | 60 00 |
| III වැනි ඡේදය … … … … … … … … | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) … … | 80 00 | 120 00 |
| II වැනි කොටස … … … … … … … … | 12 00 | 60 00 |
| III වැනි කොටස … … … … … … … … | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … … … | 23 00 | 60 00 |
| V වැනි කොටස … … … … … … … … | 123 00 | 60 00 |
| VI වැනි කොටස … … … … … … … … | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. *ඊළඟ ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2009**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| අප්‍රේල් | 2009.04.03 | සිකුරාදා | 2009.03.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.04.08 | බදාදා | 2009.03.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.04.17 | සිකුරාදා | 2009.04.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.04.24 | සිකුරාදා | 2009.04.08 | බදාදා | දහවල් | 12.00 |
| | 2009.04.30 | බ්‍රහස්පතින්දා | 2009.04.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| මැයි | 2009.05.07 | බ්‍රහස්පතින්දා | 2009.04.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.05.15 | සිකුරාදා | 2009.04.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2009.05.22 | සිකුරාදා | 2009.05.07 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2009.05.29 | සිකුරාදා | 2009.05.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජුනි | 2009.06.05 | සිකුරාදා | 2009.05.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.06.12 | සිකුරාදා | 2009.05.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.06.19 | සිකුරාදා | 2009.06.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.06.26 | සිකුරාදා | 2009.06.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.